## 14.0 කළමනාකරණ ගිණුම්කරණයේ මූලික සංකල්ප ඇගයීමට ලක් කරයි.

### 14.4 ශ්‍රම කාලය සම්බන්ධ වාර්තා තැබීම

ශ්‍රම පිරිවැය-භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමේ නියුක්ත ශ්‍රමිකයන් කැප කරන ශ්‍රමය වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව දරනු ලබන වියදම් ශ්‍රම පිරිවැය වේ.

### ශ්‍රම පිරිවැයට ඇතුළත් දෑ

1.සේවකයන්ගේ මූලික වැටුප්/වේතන
2.අතිකාල දීමනා
3.වෙනත් අතිරේක දීමනා
4.වෛද්‍ය හෝ වෙනත් විශේෂ දීමනා
5.අර්ථසාධක අරමුදලට දායක වීම.
6.සේවා නියුක්ති භාර අරමුදලට දායක වීම

### ශ්‍රම පිරිවැය පාලනය කිරීමේ වැදගත්කම

1.ශ්‍රමය ජීවී සම්පතක් බැවින් වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු වීම.

2.පිරිවැය ඒකකයක මුළු පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් ශ්‍රම පිරිවැය නියෝජනය කරන නිසා ශ්‍රම පිරිවැය පාලනයකින් යුතුව පවත්වා ගැනීම වැදගත් වීම.

3.ශ්‍රමයේ ඵලදායිත්වය ඉහළ දැමීම තුළින් නිෂ්පාදනය වැඩිවීම මත ඒකකයක පිරිවැය අවම කර ගැනීමට හැකිවීම.

ශ්‍රම කාලය වාර්තා කරන ආකාර දෙකකි.

1.පෙනී සිටින කාල වාර්තා
2.ක්‍රියාකාරී කාල වාර්තා

<u>අභ්‍යාස</u>

1.පෙනී සිටි කාල වාර්තා හා ක්‍රියාකාරී කාල වාර්තා පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.